සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2018 ජූලි

## (AA35) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

(Corporate and Personal Taxation)

2018-07-22
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (7) *ලකුණු 100 යි.*

---

## A කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**ස්ටීවන්** කැනඩාවේ පුරවැසියෙකි. බහුජාතික සමාගමක ශ්‍රී ලංකා ශාඛාවේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා වශයෙන් ඔහු පත්කරන ලදි. පළමු වතාවට රාජකාරි බාර ගැනීම සඳහා ඔහු 2016 සැප්තැම්බර් 15 දින ශ්‍රී ලංකාවට පැමිණියේය. 2016/17 තක්සේරු වර්ෂය තුළදී ඔහු දෙවරක් කැනඩාවට ගිය අතර, එහි ගතකළ මුළු දින ගණන 30 කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2016/17 තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ බදු අරමුණු සඳහා **ස්ටීවන්ගේ** වාසිකභාවය **හඳුනා දක්වන්න**.

*(ඔබගේ උත්තරය අවශ්‍ය ගණනය කිරීම් මගින් සනාථ කළ යුතුය.)* (ලකුණු 05)

## 02 වන ප්‍රශ්නය

**විජේසිංහට** 2015/16 තක්සේරු වර්ෂය සඳහා තක්සේරු දැන්වීමක් ලැබී තිබේ. තක්සේරුවක් පිළිබඳව සෑහීමට පත් නොවන ඕනෑම පුද්ගලයෙකුට එම තක්සේරුවට එරෙහිව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. කෙසේනමුත්, නියමිත කාල සීමාව තුළ අභියාචනයක් ඉදිරිපත් කිරීමට **විජේසිංහ** අසමත් වී තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) තක්සේරුවකට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට නියමිත කාල සීමාව (prescribed period) **සඳහන් කරන්න**. (ලකුණු 01)

(b) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රමාද අභියාචනයන් ඉදිරිපත් කිරීම සඳහා කාලය දීර්ඝ කිරීමක් ලබාදෙන අවස්ථාවන් දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(c) පැහැර හරිනලද බදු අයකර ගැනීම සඳහා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් යොදාගන්නා ක්‍රම දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත B සමාගමේ** 2015/16 තක්සේරු වර්ෂය සඳහා බදුවන ආදායම මත බද්ද (tax on taxable income) රු.10,235,000/- කි. සමාගම 2016/17 තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය ස්වතක්සේරු මත ආදායම් බදු ගෙවීම් සිදුකර නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) දේශීය ආදායම් පනතේ විධිවිධානයන්ට අනුව, දඩ වළක්වා ගැනීම සඳහා එක් එක් කාර්තුවකට ගෙවිය යුතු අවම කාර්තුමය ආදායම් බද්ද **ගණනය කරන්න**. (ලකුණු 01)

(b) එක් එක් කාර්තුව සඳහා ආදායම් බද්ද ගෙවිය යුතු නියමිත දින **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

තම නිවසේ ගිණුම්කරණ ආයතනයක් පවත්වාගෙන යන **සඳුන්** විසින් ගිණුම්කරණ, විගණන සහ බදු උපදේශන සේවා සපයනු ලබයි. ඔහුට ඔහුගේ සේවාදායකයන් වෙනුවෙන් නිරන්තරයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සාකච්ඡා සඳහා සහභාගී වීමට සිදුවන අතර, ඔහුගේ නිවස සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අතර ගමන් වියදම් පිරිවැය ඔහු විසින් ඔහුගේ වෘත්තිය ආදායමෙන් අඩුකර තිබුණි. කෙසේනමුත්, සහකාර කොමසාරිස්වරයා මෙම වියදම සඳහා ඉඩදී නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සහකාර කොමසාරිස්වරයාට මෙම වියදම සඳහා ඉඩනොදීම කළ හැකිදැයි **පැහැදිලි කරන්න**.

*(ඔබට නිශ්චිත නඩු තීන්දු අදාල කරගත හැකිය.)* (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

### 05 වන ප්‍රශ්නය

**ශක්ති පාට්නර්ස්** යනු **රුවන්** සහ **නුවන්** යන මිතුරන් දෙදෙනා විසින් ලාභ සහ අලාභ සම සමව බෙදා ගනිමින් පවත්වාගෙන යනු ලබන හවුල් ව්‍යාපාරයකි. ඔවුන් දේශීය වෙළෙඳපොළ සඳහා සිමෙන්ති බිම් ඇතුරුම් ගල් නිෂ්පාදනය කර විකිණීමේ නිරතව සිටියි.

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව හවුල් ව්‍යාපාරයේ පිරිවැටුම සහ ශුද්ධ ලාභය පිළිවෙලින් රු.32,354,000/- ක් සහ රු.15,620,000/- ක් විය.

(1) ශුද්ධ ලාභය ගණනය කිරීමේදී පහත සඳහන් වියදම් අඩුකර තිබේ:

| | රු. |
|---|---|
| හවුල්කරුවන්ට ගෙවූ වැටුප් | 1,200,000 |
| **නුවන්ගේ** බිරිඳට ගෙවූ වැටුප් | 600,000 |
| ගොඩනැගිල්ල සඳහා වරිපනම් | 25,000 |
| **රුවන්ට** ගෙවූ කුලී | 480,000 |
| තක්සේරු වර්ෂය තුළදී රු.960,000/- කට මිලට ගත් කොන්ක්‍රීට් මිශ්‍රකරන යන්ත්‍ර සඳහා ක්ෂය | 144,000 |

(2) ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතුවලට හවුල්කරුවන් දෙදෙනාම සහභාගී වන අතර, එක් අයෙක් මාසයකට රු.50,000/- ක් බැගින් වැටුප් ලබා ගනියි. හවුල් ව්‍යාපාරයේ ගණකාධිකාරී වන **නුවන්ගේ** බිරිඳට මසකට රු.50,000/- ක වැටුපක් ගෙවයි.

(3) ව්‍යාපාර පරිශ්‍රය **රුවන්** සතුවන අතර, හවුල් ව්‍යාපාරය ඔහුට මාසිකව රු.40,000/- බැගින් කුලී ගෙවනු ලබන අතර, රු.25,000/- ක් වූ පරිශ්‍රයේ වරිපනම් ගාස්තුව හවුල් ව්‍යාපාරය විසින් දරණු ලබයි.

(4) වාණිජ බැංකුවක පවත්වාගෙන යන ස්ථාවර තැන්පතුවක් සඳහා ලැබුණු රු.14,000/- ක පොලී ආදායම හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභයෙහි ඇතුලත් වේ. එම පොලිය මත රඳවාගැනීමේ බදු අඩුකර නොමැත.

(5) 2016 අප්‍රේල් 01 දිනට පැවති සියලු වත්කම්, බදු අරමුණු සඳහා සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණි.

(6) අනෙකුත් සියලුම වියදම් බදු අරමුණු සඳහා ඉඩදෙන වියදම් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය **ගණනය කරන්න**. (ලකුණු 04)

(b) හවුල් ව්‍යාපාරයේ ආදායම් බදු වගකීම **ගණනය කරන්න**. (ලකුණු 03)

(c) හවුල් ව්‍යාපාරයෙන් පැන නගින ලාභ සහ වෙනත් ආදායම් හවුල්කරුවන් අතර බෙදාහැරීමේ ප්‍රකාශනයක් **පිළියෙල කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත DPL සමාගම,** දේශීය සීනි නිෂ්පාදකයෙකුගේ බෙදාහරින්නෙකු වේ. එසේම, සමාගම වෙනත් ආහාර ද්‍රව්‍ය තොග හා සිල්ලර වෙළඳාමේද නිරතව සිටියි. පහත සඳහන් තොරතුරු 2017 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා ගිණුම් පොත්වලින් උපුටාගෙන ඇත:

(1) සමාගමේ විකුණුම් පහත පරිදි වේ:

| | රු. |
|---|---:|
| සීනි විකුණුම් | 8,400,000 |
| ආහාර ද්‍රව්‍ය තොග හා සිල්ලර විකුණුම් | 3,130,000 |
| **එකතුව** | **11,530,000** |

(2) ලොරි රථයක් විකිණීමෙන් ලද මුදල රු.1,620,000/- කි.

(3) සමාගම විසින් ගෙවන ලද ජාතිය ගොඩනැගීමේ බදු [Nation Building Tax (NBT)] ප්‍රමාණයන් පහත පරිදි වේ:

| | රු. |
|---|---:|
| සීනි මිලදී ගැනීම මත | 120,000 |
| දේශීයව මිලට ගත් ආහාර ද්‍රව්‍ය මත | 27,000 |

(4) 2017 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා මාසික වාරික ලෙස ජාතිය ගොඩනැගීමේ බදු රු.30,000/- ක් ගෙවා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2017 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා ගෙවිය යුතු ඉතිරි ජාතිය ගොඩනැගීමේ බද්ද **තක්සේරු කරන්න**. (ලකුණු 08)

(b) 2017 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා ජාතිය ගොඩනැගීමේ බදු වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිත දිනය **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත සුමුදු ටුවර්ස් සහ ට්‍රාන්ස්පෝර්ට්ස් සමාගම** ප්‍රවාහන සේවා සපයන, එකතු කළ අගය මත බද්ද [Value Added Tax (VAT)] සඳහා ලියාපදිංචි සමාගමකි. පහත සඳහන් තොරතුරු 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා සමාගමේ පොත්වලින් උපුටාගෙන ඇත:

(1) විකුණුම් (එකතු කළ අගය මත බදු රහිතව):

| | රු. |
|---|---:|
| සංචාරකයන් ප්‍රවාහනය කිරීමෙන් | 3,280,000 |
| පොදු මගී ප්‍රවාහනය කිරීමෙන් | 1,430,000 |
| මෝටර් රථ කුලියට දීමෙන් | 3,625,000 |
| **එකතුව** | **8,335,000** |

(2) සමාගම විසින් ගෙවන ලද යෙදවුම් බදු (Input VAT):

| | රු. |
|---|---:|
| කුලියට දීම සඳහා යොදාගන්නා මෝටර් රථවල රක්ෂණය මත | 248,000 |
| සංචාරකයින් ප්‍රවාහනයට සම්බන්ධ වියදම් මත | 137,000 |
| පොදු මගී ප්‍රවාහන සේවයට සම්බන්ධ වියදම් මත | 86,000 |

(3) සමාගම, 2017 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා වාරික වශයෙන් රු.220,000/- ක් ගෙවා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2017 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා ගෙවිය යුතු ඉතිරි / (වැඩිපුර ගෙවූ) එකතු කළ අගය මත බද්ද **තක්සේරු කරන්න**. (ලකුණු 08)

(b) 2016 මැයි 05 දිනැති බදු ඉන්වොයිසියක් මත ගෙවූ බදු ප්‍රමාණය, 2016 ජූනි 30 දිනෙන් අවසන් කාර්තුවේදී හෝ ඉන්පසු බදු කාලපරිච්ඡේදයන්හිදී ඉවදී ඇති යෙදවුම් බද්දක් (input tax) වශයෙන් සමාගම විසින් අඩුකරගෙන නොමැත. මෙය 2017 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුවේදී අඩුකර ගැනීමට සමාගම අදහස් කරයි.

එකතුකළ අගය මත බදු පනතේ ප්‍රතිපාදනයන් අනුව මෙම යෙදවුම් බද්ද අඩුකර ගැනීමට අදාල ව්‍යවස්ථාපිත කාලසීමාව (time limit) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

**සීමාසහිත සුපිපි (පෞද්ගලික) සමාගම (SPL)** වියළි මල් සැකසුම් නිෂ්පාදනය කර දේශීය වෙළෙඳපොලේ විකිණීමේ ව්‍යාපාරයේ නිරතව සිටී. 2017 මාර්තු 31 දිනට, සමාගමේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය සහ මුළු සංචිත පිළිවෙලින්, රු.20,000,000/- ක් සහ රු.8,800,000/- ක් විය.

2016/17 තක්සේරු වර්ෂය සඳහා **SPL සමාගමෙහි** පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) 2016/17 තක්සේරු වර්ෂය සඳහා සමාගමේ පිරිවැටුම සහ ආදායම් බදුවලට පෙර ශුද්ධ ලාභය පිළිවෙලින්, රු.564,600,000/- ක් සහ රු.24,650,000/- ක් විය.

(2) වෙනත් ආදායම්වල පහත දෑ ඇතුලත් විය:

| | රු. |
|---|---|
| භාණ්ඩාගාර බිල්පත්වලින් ලැබුණු පොලිය | 2,205,000 |
| ලැබූ ශුද්ධ ලාභාංශ | 564,000 |
| යන්ත්‍ර විකිණීමෙන් ලද ලාභය | 1,000,000 |
| කුලී ආදායම | 1,800,000 |
| | **5,569,000** |

(3) දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර:

- <u>වර්ෂය තුළදී අත්පත් කර ගැනීම්</u>:

| | රු. |
|---|---|
| පරිගණක | 600,000 |
| මෘදුකාංග - ආනයනය කරන ලද | 350,000 |
| ප්‍රධාන විධායක නිළධාරියා භාවිත කරන මෝටර් රථය | 4,600,000 |
| ලී බඩු | 165,000 |
| යන්ත්‍ර | 5,360,000 |
| | **11,075,000** |

- <u>වර්ෂය තුළදී සිදුකරන ලද ඉවත් කිරීම්</u>:

  2016 ජූනි 30 දින රු.1,300,000/- කට විකුණන ලද යන්ත්‍රය, 2010/11 තක්සේරු වර්ෂයේදී රු.5,000,000/- ක පිරිවැයක් දරා අත්පත් කරගන්නා ලදී. පැරණි යන්ත්‍රය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා නව යන්ත්‍රයක් 2016 ජූලි 01 දින රු.5,360,000/- ක පිරිවැයකට මිලදී ගන්නා ලදී.

- විකුණන ලද යන්ත්‍රය හැර 2016 අප්‍රේල් 01 දිනට පැවති වත්කම් මත, බදු අරමුණු සඳහා ක්ෂය දීමනා සම්පූර්ණයෙන්ම ලබාගෙන ඇත.

(4) වියදම්වල පහත ඒවා ඇතුලත් විය:

- ➢ 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අයකරන ලද ගිණුම්කරණ ක්ෂය රු.11,800,000/- කි.
- ➢ කුලියට දී ඇති ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් සමාගම රු.645,000/- ක් දරා ඇත. මෙම ගොඩනැගිල්ල **SPL සමාගම** විසින් ඉදිකරන ලද අතර, එය මාසයකට රු.150,000/- බැගින් කුලියට දී ඇත.
- ➢ **SPL සමාගම,** එහි පාලක සමාගම වන **සීමාසහිත බෙස්ට් හෝම්ස් පොදු සමාගම** වෙත රු.6,000,000/- ක කළමනාකරණ ගාස්තුවක් ගෙවා ඇත.
- ➢ **SPL සමාගමට** එහි නිෂ්පාදන කටයුතු පාරිභෝගික අවශ්‍යතාවයන් අනුව සිදුකිරීමට අවශ්‍ය විය. ඒ අනුව 2016/17 තක්සේරු වර්ෂයේදී රු.1,650,000/- ක පිරිවැයක් දරමින් වෙළෙඳපොළ සමීක්ෂණයක් සිදුකරන ලදී.
- ➢ වෙළෙඳපොළ සමීක්ෂණයෙන් ලද ප්‍රතිඵල පදනම් කර ගනිමින් ගුණාත්වය වැඩිදියුණු කිරීම සඳහා බාහිර ආයතනයක් විසින් කාර්මික පර්යේෂණයක් සිදුකරන ලදී. සමාගම වර්ෂය තුළදී රු.2,500,000/- ක් පර්යේෂණ ගාස්තු වශයෙන් ගෙවා තිබේ.
- ➢ සමාගම එහි පාලක සමාගම වන **සීමාසහිත බෙස්ට් හෝම්ස් පොදු සමාගම** වෙතින් රු.90,000,000/- ක ණය මුදලක් ලබාගෙන තිබේ. වර්ෂය තුළදී සමාගම පොලිය වශයෙන් රු.7,127,500/- ක් පාලක සමාගමට ගෙවා තිබෙන අතර, එය මූල්‍ය වියදම්වලට ඇතුලත් කර තිබේ.
- ➢ 2016/17 තක්සේරු වර්ෂය තුළදී, ආර්ථික වශයෙන් පසුබෑමකට ලක්ව ඇති ගම්මානයක් ලෙස ගැසට් කරන ලද ග්‍රාමීය ප්‍රදේශයක ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා සමාගම රු.12,000,000/- ක පරිත්‍යාගයක් සිදු කරන ලදී.

(5) අනෙකුත් සියලුම වියදම් බදු අරමුණු සඳහා ඉඩදෙන වියදම් වේ.

(6) සමාගමට, 2015/16 තක්සේරු වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ රු.20,000,000/- ක බදු අලාභයක් තිබේ.

(7) සමාගම ස්වතක්සේරු ආදායම් බදු ගෙවීම් වශයෙන් රු.1,000,000/- ක් ගෙවා ඇත.

(8) 2016/17 තක්සේරු වර්ෂය සඳහා ගෙවූ ආර්ථික සේවා ගාස්තුව [Economic Service Charge (ESC)] රු.2,832,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2016/17 තක්සේරු වර්ෂය සඳහා පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) මුළු ව්‍යවස්ථාපිත ආදායම,

(b) තක්සේරු කළ හැකි ආදායම,

(c) බදු අයකළ හැකි ආදායම,

(d) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ,

(e) ගෙවිය යුතු ඉතිරි බද්ද.

***සැ.යු:*** *යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුය.* (ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

වාසික පුද්ගලයෙකු වන **රමල්** ප්‍රසිද්ධ නිෂ්පාදන සමාගමක කම්හල් කළමනාකරුවෙකු වශයෙන් සේවය කරයි. 2016/17 තක්සේරු වර්ෂය (මින්මතු 'වර්ෂය' යැයි හැඳින්වෙන) සඳහා **රමල්** සම්බන්ධව පහත සඳහන් තොරතුරු සපයා ඇත.

(1) වර්ෂය තුළදී ඔහුට, ඔහුගේ සේවායෝජකගෙන් පහත සඳහන් දෑ ලැබී තිබේ:

- දළ වැටුප - මාසයකට රු.160,000/- බැගින්.
- 2017 මාර්තු මාසයේදී රු.200,000/- ක ප්‍රසාද දීමනාවක් ලැබී තිබේ.
- කර්මාන්ත ශාලාව ආසන්නයේ කුලී නිවසක ඔහු ඔහුගේ පවුල සමග වාසය කරයි. කුලිය මාසයකට රු.35,000/- බැගින් විය. සමාගම ඔහු විසින් ගෙවන ලද කුලිය ප්‍රතිපූර්ණය කරනු ලබයි.
- වර්ෂය තුළදී ඔහුගේ පුත්‍රයා වන **හිරුන්** 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත්වූ අතර, ඔහුගේ ජයග්‍රහණය වෙනුවෙන් සමාගම රු.50,000/- ක ත්‍යාගයක් ලබාදෙන ලදී.

(2) ඉංගිරිය ප්‍රදේශයේ පිහිටි ඔහුගේ පියාගෙන් උරුම වූ පාරම්පරික නිවස (වරිපනම් අරමුණු සඳහා රු.60,000/- කට තක්සේරු කරන ලද) විටින්විට යෑම සඳහා ඔහු විසින් භාවිතයට ගනියි.

(3) මීට අමතරව, **රමල්** ට රු.240,000/- කට තක්සේරු කරන ලද තට්ටු නිවාසයක් කොළඹ තිබේ. මෙම තට්ටු නිවාසය මසකට රු.40,000/- බැගින් ගෘහ භාණ්ඩ සමග විදේශිකයෙකුට කුලියට දී තිබේ. **රමල්** 30% බැගින් වරිපනම් සහ ගෘහ භාණ්ඩ අළුත්වැඩියාව සඳහා රු.26,000/- ක් වර්ෂය තුළදී ගෙවා තිබේ.

(4) ඔහුගේ පුත් **හිරුන්** ට වාණිජ බැංකුවක ඉතිරිකිරීමේ ගිණුමක් තිබෙන අතර, වර්ෂය තුළදී දළ පොලිය ලෙස රු.29,250/- ක් ලැබී තිබුණි.

(5) වර්ෂය තුළදී, භාණ්ඩාගාර බිල්පත්වල කරන ලද ආයෝජන සඳහා පොලිය වශයෙන් රු.121,500/- ක් **රමල්** ට ලැබී තිබේ.

(6) වර්ෂය තුළදී ලැබුණු ලාභාංශ පහත සඳහන් පරිදි වේ:

| | **රු.** |
|---|---:|
| ලාභාංශ - බදු නිදහස් ලාභවලින් | 17,500 |
| ලාභාංශ - 10% ක් බැගින් රඳවාගැනීමේ බදු අඩු කිරීමට යටත් වූ වෙනත් සමාගම්වලින් ලැබුණු ලාභාංශ | 27,000 |
| | **44,500** |

(7) **රමල්** මිළ ලැයිස්තුගත සමාගම් කිපයක කොටස්වල ආයෝජනය කර ඇති අතර, වර්ෂය තුළදී කොටස් වෙළඳාමෙන් රු.56,000/- ක අලාභයක් ඔහු දරා තිබේ.

(8) වර්ෂය තුළදී **රමල්** විසින් පහත සඳහන් පරිත්‍යාගයන් කරන ලදී:

- ඔහුගේ ගමේ විහාරස්ථානයට රු.50,000/- ක මුදල් පරිත්‍යාගයක්.
- ජාතික වකුගඩු අරමුදලට රු.100,000/- ක මුදල් පරිත්‍යාගයක්.

(9) ස්වතක්සේරු පදනම මත ඔහු රු.10,000/- ක ආදායම් බදු ගෙවීම් කර තිබේ.

(10) වර්ෂය සඳහා අඩුකළ උපයන විට ගෙවීමේ බද්ද (PAYE) රු.166,400/- කි.

ඉහත සඳහන් තොරතුරු ඇසුරෙන්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

2016/17 තක්සේරු වර්ෂය සඳහා **රමල්ගේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**.

(a) බදු අයකළ හැකි ආදායම,

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද,

(c) ගෙවිය යුතු ඉතිරි බද්ද, සහ,

(d) බදු නිදහස් ආදායම (වේ නම්). (ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |